

# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

## SOUTHERN PROVINCIAL COUNCIL



**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**

கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா துறை அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.** கீழ் மாடி, "தக்சிண பாய", லபுகுவ, காலி, Ground Floor, "Dakshina Paya", Labuduwa, Galle.

| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/Edumin/Ad/13/25 | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.08. 26 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

<u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>
<u>අනධ්‍යයන සේවක සේවය - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>

උක්ත කරුණ සම්බන්ධව මගේ අංක SP/Edumin/Ad/18/25 හා 2025.06.17 දිනැති ලිපිය හා බැඳේ.

02. අදාළ ලිපිය මඟින් මගේ අංක 01/2025 දරණ දකුණු පළාත් අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය ප්‍රකාරව 2025 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ හා ඉන් අනතුරුව මගේ අංක SP/Edumin/Ad/18/25 හා 2025.07.25 දිනැති ලිපිය මඟින් අභියාචනා සලකා බලා අභියාචනා මණ්ඩල තීරණ ද දැනුම් දෙන ලදී.

03. එකී අභියාචනා මණ්ඩල තීරණ සම්බන්ධව නැවත වරක් ගරු ආණ්ඩුකාරතුමා වෙත හා අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අභියාචනා අවසාන වශයෙන් සලකා බලා සිදු කරන ලද සංශෝධන තීරණ (edumin.sp.gov.lk) තනතුරු අනුව අමාත්‍යාංශ වෙබ් අඩවියේ මෙම ලිපියට ඇමුණුම් ලෙස දක්වා ඇත.

04. ඒ අනුව මෙම ලිපියට ඇමුණුම් ලෙස යොදා ඇති එකී සංශෝධනයන්ට යටත්ව දකුණු පළාත් අනධ්‍යයන සේවක සේවයේ 2025 වාර්ෂික ස්ථාන මාරු තීරණ 2025.09.01 දිනට ක්‍රියාත්මක කිරීමට මෙයින් දන්වා සිටිමි.

05. ඒ අනුව ඔබ කලාපයේ ස්ථාන මාරු නියෝග ලැබ ඇති සියලු නිලධාරීන් වෙත ස්ථාන මාරු ලිපි නිකුත් කිරීමට කටයුතු කරන ලෙසත්, සෑම ස්ථාන මාරුවක් සම්බන්ධවම අදාළ නිලධාරියාගේ පුද්ගලික ලිපි ගොණුවට පිටපතක් ඇතුලත් කල යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

06. තවද ස්ථාන මාරු නියෝග ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර, අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙන තෙක් රඳවා ගැනීමෙන් තොරව අදාළ නිලධාරීන් සතුව ඇති රජයට අයත් බඩු බාහිරාදිය හා ලිපි ලේඛන ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන නිලධාරියෙකු වෙත භාර දී නව සේවා ස්ථානයේ නියමිත දිනට රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි, ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කල යුතු බවට සියලු ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් මෙයින් වැඩිදුරටත් දන්වා සිටිමි.

සඳමාලි කේ. ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ලේකම් වෙනුවට
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
දකුණු පළාත.

සඳමාලි කේ ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

අත්/කලේ: එන්.කේ.ආර්.පතිරණ
ලේකම්


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: 091-2246159
ලේකම් / செயலாளர் / Secretary: 091-2246156, 091-2030701
කාර්යාල / காரியாலயம் / Office: 091-2030708 පාලන/நிர்வாகம்/Administration; 091-2030705 අධ්‍යාපන/கல்வி/Education; 091-2030703 සැලසුම්/திட்டமிடல்/Planning
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091-2246157, 091-2246156, 091-2234044